# හම්බන්තොට දිස්ත්‍රික්කය

| පළාත් පාලන ආයතනය | පවත්නා මුළු පහන් සංඛ්‍යාව | පවත්නා පහන් සඳහා | | LED පහන් යෙදීමෙන් | | | | දිනකදී ඉතිරි වන | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දිනකදී වැය වන විදුලි ඒකක ගණන (kWh) | දිනකදී වැය වන මුදල (රු) | දිනකදී වැය වන විදුලි ඒකක ගණන (kWh) | | | දිනකදී වැය වන මුදල (රු) | විදුලි ඒකක ගණන (kWh) | මුදල (රු) |
| | | | | මුළු පහන් සංඛ්‍යාවෙන් 50% ක් 12.5W LED යෙදීමෙන් | මුළු පහන් සංඛ්‍යාවෙන් 50% ක් 20W LED යෙදීමෙන් | එකතුව | | | |
| 1.කටුවන ප්‍රාදේශීය සභාව | 217 | 81.48 | 1385.16 | 16.28 | 26.04 | 42.32 | 719.36 | 39.17 | 665.81 |
| 2.ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව | 1300 | 648.00 | 11016.00 | 97.50 | 156.00 | 253.50 | 4309.50 | 394.50 | 6706.50 |
| 3.බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව | 2209 | 686.45 | 11669.62 | 165.68 | 265.08 | 430.76 | 7322.84 | 255.69 | 4346.78 |
| 4.අඟුණුකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව | 2071 | 819.97 | 13939.52 | 155.33 | 248.52 | 403.85 | 6865.37 | 416.13 | 7074.16 |
| 5.වීරකැටිය ප්‍රාදේශීය සභාව | 3032 | 1459.37 | 24809.26 | 227.40 | 363.84 | 591.24 | 10051.08 | 868.13 | 14758.18 |
| 6.හම්බන්තොට මහා නගර සභාව | 1120 | 543.50 | 9239.57 | 84.00 | 134.40 | 218.40 | 3712.80 | 325.10 | 5526.77 |
| 7.තංගල්ල ප්‍රාදේශීය සභාව | 2523 | 710.08 | 12071.29 | 189.23 | 302.76 | 491.99 | 8363.75 | 218.09 | 3707.55 |
| 8.හම්බන්තොට ප්‍රාදේශීය සභාව | 1870 | 517.61 | 8799.34 | 140.25 | 224.40 | 364.65 | 6199.05 | 152.96 | 2600.29 |
| 9.සූරිය වැව ප්‍රාදේශීය සභාව | 1783 | 561.85 | 9551.48 | 133.73 | 213.96 | 347.69 | 5910.65 | 214.17 | 3640.84 |
| 10.තංගල්ල නගර සභාව | 927 | 452.46 | 7691.82 | 69.53 | 111.24 | 180.77 | 3073.01 | 271.70 | 4618.82 |
| 11.තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව | 1852 | 485.82 | 8258.94 | 138.90 | 222.24 | 361.14 | 6139.38 | 124.68 | 2119.56 |
| 12.අම්බලන්තොට ප්‍රාදේශීය සභාව | 2946 | 707.04 | 12019.68 | 220.95 | 353.52 | 574.47 | 9765.99 | 132.57 | 2253.69 |
| එකතුව | **21850.00** | **7673.63** | **130451.68** | **1638.75** | **2622.00** | **4260.75** | **72432.75** | **3412.88** | **58018.93** |

**විදුලි ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය රු.17 ක් ලෙස සලකා ඇත.**

# ...වීදි පහනක් අලුත්වැඩියා කළ
# ...ප්‍රා.සභා සේවකයා මියයයි

(අහංගම සුමතිපාල දියගහගේ සහ උණවටුන ඩී.ජී. සුගතපාල)

යක්කලමුල්ල වඳුරඹ මහා මාර්ගයේ ඊයේ (8) වීදි පහනක් ...ලුත්වැඩියා කරමින් සිටි යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ විදුලි ...ංශයේ සේවකයකු විදුලිසැර වැදී මියගොස් ඇතැයි ...ක්කලමුල්ල පොලිසිය පවසයි.

මෙසේ මියගොස් ඇත්තේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ ...විදුලි අංශයේ සේවය කරමින් සිටි ඉමදූව වල්පොල ...දිංචිකරුවකු වන දේවගේ කපිල රණසිංහ නමැති තිස් ...දෙහැවිරිදි පුද්ගලයෙකි. විදුලිසැර වැදීමෙන් පසුව මොහු ...කරාපිටිය රෝහලට ඇතුළුකර ඇතත් මියගොස් ඇති බව ...වාර්තා වේ.

යක්කලමුල්ල පොලිසිය මේ පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 28/2016

මගේ අංකය: EST-2/05/POL/0079

රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2016.12.01

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රැකියාවලට බඳවා ගැනීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පිළිගැනීම</u>

සේවා ව්‍යවස්ථාවල හා බඳවා ගැනීම් පරිපාටිවල තාක්ෂණික හා කාර්මික අංශවල තනතුරු සඳහා බඳවා ගැනීමේ දී වෘත්තීය සුදුසුකම් ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 හෝ සමඟ අධ්‍යාපන සුදුසුකම් ලෙස අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) හෝ ඇතුළත් කර ඇති අවස්ථාවක දී NVQ 3 හා NVQ 4 සුදුසුකම් ලබා තිබීම පිළිවෙළින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාග සමත්වීම හා සමාන ලෙස සැලකීමට 2016.06.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02 ඒ අනුව තාක්ෂණික හා කාර්මික අංශවල තනතුරු සඳහා බඳවා ගැනීමේ දී ඉල්ලා සිටින ඉහත අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නමුත් ජාතික වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට ද එම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට ඉඩදීමටත්, බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් අධ්‍යාපනික සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නම් එම අයදුම්කරුවන් අදාළ තනතුරු සඳහා බඳවා ගැනීමටත් හැකිය.

03. ඉහත 02 ඡේදයේ විධිවිධාන ඇතුළත් කරමින් අදාළ සේවා ව්‍යවස්ථා සහ බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය ලබාගැනීමට අදාළ පත්කිරීම්/ පරිපාලන බලධරයන් කටයුතු කළ යුතුය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

# පළාත් පාලන බල ප්‍රදේශ තුළ මාර්ග ආලෝක කරනය

# 2018/12/27 විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

01. මාර්ග ආලෝකනය :- මාර්ගය නිර්වචනයේදී ඇවිදින මං තීරු walk ways , වීථි street ,අඩිපාර foot path,මාවත avenue,පාර road, මහා මාර්ග High Way සහ අධිවේගී මාර්ග Express high way ඇතුලත් බැවින් ඉදිරියේදී වීථි වෙනුවට පොදු වශයෙන් මාර්ග යන වචනය භාවිතා කිරීමටත් එම මාර්ග ආලෝකන පද්ධතිය මාර්ග ආලෝකන පහන් ලෙසත් හැඳින්වීම කළ යුතු වේ.

02. මාර්ග ආලෝකනයේ මූලික අරමුණු.

I. පදිකයන් ඇතුළු සියළු සත්වයන්ගේ ආරක්ෂාව.
II. සොර සතුරු බිය අවම කර ගැනීම.
III. රාත්‍රියේ සුරක්ෂිත බව.
IV. අලංකරණය.
V. දේපල වල ආරක්ෂාව.

03. පළාත් පාලන ආයතන සතු වගකීම්.

පළාත් පාලන ආඥා පනත් පනත් සහ අතුරු ව්‍යවස්ථා අනුව උපයෝගීතා සේවා සැපයීමේදී එම පළාත් පාලන ආයතන වලට බල තල සහ වගකීම් පැවරී ඇති බැවින් මාර්ග ආලෝක කරනය නියමිත අන්දමින් සිදු කිරීමට එකී ආයතනය බැඳී සිටී.

04. 1988/03/16 දිනැති මාගේ අංක අයි.පී.ඊ/පී.ඊ/12/31 විදුලි බල සහ බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේකන ලිපිය.

I. පළාත් පාලන ආයතන වල මාර්ග ආලෝකන පහන් වර්ග ක්ෂමතාවය සහ සංඛ්‍යාව, අනුමත මාසික විදුලි පරිභෝජන ඒකක සංඛ්‍යාව සහ ( Dom GP 1.1 – G 1.2) දැනුම්වත් කිරීම සහ නඩත්තු වියදම් ලබා දීම බල පත්‍ර ලාභී සැපයුම් ආයතන සංඛ්‍යාන (data) පවත්වාගෙන යාම සහ යාවත් කාලීන කිරීම.
II. ඒ අනුව එක් එක් පළාත් පාලන බල ප්‍රදේශ වල අනුමත කරනු ලබන මාර්ග ආලෝකන පහන් සඳහා වන මාසික විදුලි ඒකක ප්‍රමාණය පිළිබඳ අදාල අංශ දැනුම්වත් කිරීම.

05. පළාත් පාලන ආයතන වල එක් එක් මාර්ග අනුව නිර්දේශ ආලෝක මට්ටම (LUX levels )

- නිර්දේශ කරනු ලබන පහන් වර්ගය සහ ක්ෂමතාවය (W)
- එම මාර්ග ආලෝකන පහන් අතර පරතරය සහ නියමිත උස.
- මංසන්ධි වල (WARM white) පහන් සවි කිරීම.
- අදාල ප්‍රමිතීන් සහ පිරිවිතර යාවත්කාලීන කිරීම සහ නියමිත අන්දමින් භාවිතා කරනු ලබන්නේද යනවග. (SLS /CFL-LED) SLS approved Makes

**පළාත් පාලන ආයතන වල වගවීම්.**

- අනුමත ඒකක සීමාව තුල මාර්ග ආලෝකන පහන් පද්ධතිය පවත්වාගෙන යාම නියමිත පරිදි ලේඛන පවත්වා ගෙන යාම (Inventory or Register )
- නියමිත ප්‍රමිතීන් සහ පිරිවිතර අනුකූලව ද්‍රව්‍ය භාවිතය.
- මංවර එළිකිරීමේ දී අවශ්‍ය සහය ලබා දීම.
- නියමිත වේලාවන්හීදී මාර්ග ආලෝකන පහන් දැල්වීම සහ නිවීම.
- සුදුසු පුහුණුවක් ලත් සේවකයන් සේවයේ යෙදවීම.
  NVQ සුදුසුකම් සහිත එම සේවකයන්ගේ රාජකාරී කටයුතු විදිමත් කිරීම.

**දත්ත එක්රැස් කිරීම**

- පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශයේ මූලිකත්වය ගැනීම.මෙම අවස්ථාවේදී 2018 වර්ශයේ මාර්තු මාසයේදී පැවති, භාවිත දත්ත පදනම් කර ගැනීම සුදුසු වනු ඇත.
- ගිවිසුම් ගත වීම් තුළ පාරිභෝගිකයාව අවශ්‍යවන්නේ නම් ඔවුන්ගේ මාසික බිලට ඇතුළත්ව අනුමත ක්‍ෂමතාවයේ සුදුසු පහන් සවි කිරදීම, පාරිභෝගිකයාගේ සහාය මත (ද්‍රව්‍ය ලබා දීම ) එම පහන් නඩත්තු කිරීම.

**යෝජනා**

01. විදුලි ස්ථාපනය කිරීම සඳහා සුදුසු කාර්මිකයන් ලේඛන ගත කිරීම.
    ලියාපදිංචිය - සේවයේ යෙදවීම අනිවාර්ය කිරීම. (NVQ සුදුසුකම් සහිත)
02. විදුලි ස්ථාපන පරීක්‍ෂාව සිදුකර පාරිභෝගිකයන් දැනුම්වත් කිරීම.
    (විදුලි සැපයුම් ලබා දීමට පෙර පළමු වර පරීක්‍ෂාව සිදු කිරීම (Installation Test)
03. රාජ්‍ය ආයතන වල විදුලි ස්ථාපනය පරීක්‍ෂාව සහ විධිමත් බව සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම. (Earth Leakages)
04. අඩු සැර සම්ප්‍රේෂන මාර්ග සඳහා Aerial Boundle Conductor with Roadways highting control wire) මාර්ග ආලෝකන පාලක වයර සහිත බන්ඩල් කන්ඩක්ටර් භාවිත.